මෙහෙයුම් උපදෙස් අංක :- RDD/ PR- COVID19/2020/04

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො 30, ජනාධිපති මාවත,
කොළඹ 01

2020.06.19

**"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකම යටතේ ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත**

**"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකමට අදාල මෙහෙයුම් උපදෙස් සඳහා වූ පරිශිෂ්ඨය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ විසින් 2020.04.06 දින නිකුත් කරන ලද (සංශෝධිත) මෙහෙයුම් උපදෙස් අංක RDD/PR-COVID19/2020/20 ට වැඩිමනත්ව නිකුත් කරන ලද මෙම පරිශිෂ්ඨය මගින් COVID-19 වසංගත සමය තුල බලපෑමට ලක් වූ ව්‍යාපාර නැවත ගොඩනැගීමට අවශ්‍ය පහසුකම් සැපයීමට, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත බලතල සැපයේ.

**01. හැඳින්වීම**

මෙම පරිශිෂ්ඨයේ අරමුණ වන්නේ COVID-19 වසංගතයෙහි බලපෑමට ලක්වූ ව්‍යාපාර සඳහා ප්‍රතිපාදන සැලසීම වන අතර මේ සම්බන්ධව පෙර නිකුත් කරන ලද උපදෙස් වලට අමතරව මෙම උපදෙස් ඇතුලත් වේ.

**02. සුදුසුකම් ලත් මූල්‍ය ආයතන**

මේ වන විටත් "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" පහසුකම යටතේ ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු, මෙම පරිශිෂ්ඨයේ අරමුණු සඳහා සුදුසු වේ.

**03. සුදුසුකම් ලත් ව්‍යාපාර/ණය ගැනුම්කරුවන්**

3.1 මුදල් මණ්ඩලයේ 2020.03.27 දිනැති අංක 05 දරණ චක්‍රෙල්ඛයෙහි 02 කොටස අනුව, COVID-19 වසංගතයෙහි බලපෑමට ලක් වූ ව්‍යාපාර

3.2 දැනටමත් COVID-19 පුනරුද පහසුකම යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ඇති ණය ගැනුම්කරුවන් මේ යටතේ නැවත ණය මුදලක් ලබා ගැනීම සඳහා සුදුසුකම් නොලබයි.

**04. අරමුදල්**

මෙම පරිශිෂ්ඨය යටතේ ලබාදෙන ණය ප්‍රමාණය රු. බිලියන 120ක උපරිමයක් දක්වා වේ. පළමු අදියර ඇතුලත් ව යොදවා ඇති මුළු අරමුදල් ප්‍රමාණය රු. බිලියන 150 ක් වේ.

**05. ක්‍රියාත්මක වන දිනය**

මෙම පරිශිෂ්ඨය 2020.06.19 දින සිට ක්‍රියාත්මක වේ.

**06. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ණය ගැනුම්කරුවන්ගේ තොරතුරු ලබා දීම.**

6.1 බලපත්‍රලාභී වාණිජ බැංකු වල ප්‍රධාන ශාඛාව මගින් ණය මුදල් ලබා ගැනිමට අපේක්ෂිත ණය ගැනුම්කරුවන්ගේ සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලැයිස්තුවෙහි දෘඩ පිටපත්, බලය ලත් නිලධාරී විසින් අත්සන් කරන ලදුව ( ඇමුණුම i පරිදි ) ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කල යුතුය. එම අවස්ථාවේදීම ඇමුණුම i හි මෘදු පිටපතක්ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලබා දී ඇති ඊමේල් ලිපිනය වෙත යොමු කල යුතුය.

6.2 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පහත කරුණු පිළිබඳව සහතික විය යුතුය.

a. ඇමුණුම I අඩංගු තොරතුරු වල නිවැරදිභාවය හා අනුකූලතාව.
b. ණය යෝජනා ක්‍රමය යටතේ ණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් පිළිබඳව තක්සේරුව.
c. අවශ්‍ය සියලු තොරතුරු හා ලේඛන එක් රැස් කර ඇති බව සහ
d. ණයකරු විසින් මෙම ණය යොජනා ක්‍රමය යටතේ වෙනත් කිසිදු සහභාගීත්ව මූල්‍ය ආයතනයකින් ණය අයදුම්කර නොමැති බවට අයදුම්කරුගෙන් ලිඛිතව සහතික කිරිමක් ලබා ගැනීම.

6.3 සහභාගීත්ව මූල්‍ය ආයතනයක් හරහා ඇමුණුම I ලැබීමෙන් පසුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් එහි සඳහන් තොරතුරු නිවරදි බව තහවුරු කිරිමෙන් පසුව ණය මුදල මුදා හැරීම සඳහා ණයකරුගේ සුදුසුකම සහ ණය මුදල තහවුරු කෙරේ.

6.4 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ණය අයදුම්පත් ලැයිස්තු යොමුකිරීමේ අවසන් දිනය 2020.08.31 දින වේ.

**07. බැංකු වෙත අරමුදල් මුදා හැරීම.**

7.1 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඇමුණුම I ට අදාලව සුදුසුකම් තහවුරු කර ණය මුදල් ප්‍රමාණය අනුමත කිරිමෙන් පසුව, බැංකු විසින් ඉහත 6.3 හි සඳහන් ආකාරයට අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණයට අදාල පොරොන්දු පත්‍රය ඇමුණුම 2 අනුව සකස් කොට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතුය.

7.2 බැංකු විසින් ඉදිරිපත් කරන පොරොන්දු පත්‍ර පහත අයිතම මගින් සුරක්ෂිත වී තිබිය යුතුය.

a. ගණුදෙනු කල හැකි භාණ්ඩාගාර බිල්පත්, පොරොන්දු පත්‍ර, ණයකර, සුරකුම් පත්, ඇප පත්‍ර, හෝ වෙනත් ගනුදෙනු කල හැකි රජයේ සුරුකුම්පත්
b. රන් කාසි හෝ ගන රන්
c. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර තීරණය කරන පරිදි වෙනත් ණය පත්‍ර

7.3 සුරකුම් අයිතම සඳහා අදාල වන සීමාව (Haircut) 10% ක් වේ. වරින් වර මෙම සීමාව වෙන් කිරිවේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුවේ. සුරකුම් අයිතම වල සීමාවෙහි අඩුවක් සිදුවු විට එය වහා පිරිමසා ගත යුතුය.

7.4 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන පොරොන්දුපත්‍ර වල පිළිගත හැකි බව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් තීරණය කරන අතර, ඒ අනුව මුළු ණය මුදල මුදා හැරීම තීරණය වේ.

7.5 ඉහත 7.4 හි මුදාහරින ණය ප්‍රමාණය දින 180 ක කාල සීමාවක් සඳහා වන අතර වාර්ෂිකව 1% ක පොලී අනුපාතිකයකට යටත් වේ. කල් පිරීමේදී ඒ සමාන නව පොරොන්දු පත්‍රයක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත කඩිනමින් ඉදිරිපත් කළ යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් නව පොරොන්දු පත්‍රයේ වලංගුතාවය දන්වනු ඇත.

7.6 ඉහත කරුණු වලට අමතරව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඉදිරිපත් කරන ලද දින 270 කට නොවැඩි වට්ටම ලබා දීම තුළින් බැංකු වලට නිෂ්පාදන, ශිල්පීය නිෂ්පාදන, කෘෂිකාර්මික නිෂ්පාදන, සත්ත්ව නිෂ්පාදන, බණිජ හෝ වෙනත් කාර්මික නිෂ්පාදන යන අංශ වලට ණය ලබා දීමට කටයුතු සැලසේ .

7.7 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාල ණය ප්‍රමාණය මුදා හැරීමෙන් පසු සතියක් ඇතුලත අදාල මෙම පරිශිෂ්ඨය යටතේ සුදුසුකම් ලත් එක් එක් ණය අයදුම්කරුවන්ට හිමි ණය මුදල ලබා දීම බැංකු සතු වගකීමක් වේ.

7.8 ණය ආපසු ගෙවීමේ උපරිම කාල සීමාව මාස 24ක් දක්වා වන අතර මාස 06 ක සහන කාලයක්ද ඊට ඇතුලත් වන අතර ණය අයදුම්කරුවන් විසින් සහන කාලය තුල පොළිය ගෙවිය යුතුය .

**08. වාර්තාකරණය**

ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මෙම පරිශිෂ්ඨය යටතේ අරමුදල් යොදවා ඇති ආකාරය පිළිබඳ වාර්තාවක් සෑම දින 14කට වරක්ම එනම් සෑම මසකම 15 සහ 30 යන දෙදින සිට කාර්යාල දින 03 ඇතුලත ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දිය යුතුය.

**09. අධීක්ෂණය**

මෙම පරිශිෂ්ඨයට අදාල ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ බැංකු අධීක්ෂන දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධව සිදු කෙරේ.

**10. වෙනත්**

අවශ්‍ය විටදී මෙම පරිශිෂ්ඨයෙහි අඩංගු නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමේ හෝ සංශෝධන කිරීමේ බලතල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේතුවේ අධ්‍යක්ෂ සතුවේ.

මෙයට විශ්වාසී

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යකෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව